මව්බිම රකින්නේ ජවයේ බලයෙන් ය

යෝධ සවිය ලැබුනේ දෙවි පිහිටෙන් ය

දහදුක් විඳින්නේ අප සැම වෙනුවෙන් ය

මා ජීවත් වුණේ ලද පිය සෙනෙහෙන් ය

මොළකැටි වදන් ඔබෙ සවනට තෙපලන්න

මා හඬනා විට තුරුලට අරගන්න

ඔබ දණ ගැසූ විට අලියා පිට යන්න

මතකයි බලා උන් හැටි මා නැළවෙන්න

තුරුලට වෙලා පිය උණුහුම විඳගන්න

පින් මදි වෙන්න ඇති උකුලට වී ඉන්න

එල්ලී ඇඟිල්ලේ ඉස්කෝලෙට යන්න

මැව්වෙමි සිහින සඟවා කඳුලැළි ගොන්න

තව තව ජවය ලැබ සතුරන් මැඬලන්න

මව් බිම රැකගන්න එහි කෙසරිඳු වෙන්න

මා තුරුලට අරන් පිය උණුහුම දෙන්න

මගෙ ලෝකයේ හිරු වී මා වෙත එන්න

මගෙ ලෝකයේ හිරු වී මා වෙත එන්න

(SinduLanthaya.com)

Title - Ma Wetha Enna

Artist - Kanchana Anuradhi

Music - Suresh Maliyadde

Lyrics - Gen.Kamal Gunarathne